(01) 00458

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන අංශය

නීතිවේදී උපාධි පාඨමාලාව - හතරවන මට්ටම

අවසන් පරීක්ෂණය 2017/2018

ගිවිසුම් නීතිය - **LWU2311/LLU4805**

කාලය - පැය 03

---

දිනය - 2020 පෙබරවාරි 22 | වේලාව - පෙ.ව. 09.30-ප.ව.12.30

---

**සම්පූර්ණ ප්‍රශ්න ගණන - 08**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**I කොටසින් ප්‍රශ්න එකක් (01) සහ II කොටසින් ප්‍රශ්න හතරක් (04) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**I කොටස - නියෝජ්‍යත්ව නීතිය**

**එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

1. ශලිනි නගරයේ ප්‍රසිද්ධ කේක් සාදන්නියකි. 'කේක් ටෝක්ස්' නමින් ඇය සතුව කේක් අලෙවි හලක් තිබෙන අතර අදාල අලෙවි හලේ ඇණවුම් බෙදාහැරීම සහ විකිණීම් කටයුතු කළමනාකරනය සඳහා ඇය මහීම සහ සමීර්ව තම නියෝජිතයින් ලෙස පත් කලාය. ශලිනිගේ අනුදැනුමකින් තොරව මහීම 'කේක් ටෝක්ස්' හි කේක් නිෂ්පාදන එක් ඒකකයකට සියයට දහයක වැඩි මිලක් එකතු කරමින් අලෙවි කලේය. තවද ශලිනිට කිසිදු දැනුම් දීමක් සිදු නොකොට මහීම එම නගරයේම 'කප් කේක් ටෝක්ස්' නමින් නව අලෙවි සැලක් විවෘත කල අතර 'කේක් ටෝක්ස්' හි සුපුරුදු ගනුදෙනුකරුවන්ගෙන් කප් කේක් සඳහා එන ඇණවුම් තමා විසින් භාර ගන්නට පටන් ගත්තේය. තම අලෙවි සැල පවත්වා ගෙන යාමේ කටයුත්ත වෙනුවෙන් හෙතෙම සමීර්ව සේවයේ යෙදවූයේය. මෙ අතර 'කේක් ටෝක්ස්' හි නියෝජිතයෙක් ලෙස මහීම එහි ගනුදෙනුකරුවන්ට 'කප් කේක් ටෝක්ස්' හි නිෂ්පාදිත ගුණාත්මකභාවයෙන් අඩු කප් කේක් ප්‍රමාණයක් අලෙවි කලේය.

   'කේක් ටෝක්ස්' හි සේවාදායක පිරිස සහ ව්‍යාපාර විධික්‍රම උකහා ගැනීමෙන් ඉක්බිති මහීම සිය රැකියාවෙන් ඉවත් විය.

ඇකියාවෙන් ඉවත් වීමට ප්‍රථම මහීම 'කේක් ටෝක්ස්' නමින් බැංකුවකින් රුපියල් මිලියන 01 ක ණය මුදලක් ගෙන තිබෙන බව ශලිනිට පසුව දැනගන්නට ලැබුණි.

නියෝජ්‍යාත්ව නීතිය යටතේ ඉහත කී ගනුදෙනුවල නෛතික ප්‍රතිවිපාක සාකච්ඡා කොට ශලිනිට උපදෙස් ලබාදෙන්න. (ලකුණු 20)

2. පහත දැක්වෙන ප්‍රකාශවල වලංගුතාවය සාකච්ඡා කරන්න.
   i. නියෝජිතයෙක් ඔහුගේ හෝ ඇයගේ ප්‍රධානියා වෙත ඉටු කල යුතු යම් යම් යුතුකම් පවතී.
   ii. නියෝජිතයා සමග පමණක් ගනුදෙනු කිරීමට තෙවන පාර්ශවයකට අවශ්‍ය නම් අනාවරණය නොකල ප්‍රධානියෙක්ට ගිවිසුම සම්බන්ධයෙන් මැදිහත්වීම් කල නොහැක.

(10×2= ලකුණු 20)

**II කොටස - ගිවිසුම් නීතිය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිලිතුරු සපයන්න.**

3. පහත දැක්වෙන නඩු තීන්දු අතරින් ඕනෑම හතරක් (04) තෝරාගෙන ඒවා මගින් තහවුරු කල නෛතික සංකල්ප පැහැදිලි කරන්න.
   (අ) *Entores Ltd. v. Miles Far East Corporation* (1888) 20 A.B.D 640
   (ආ) *Central London Property Trust v. High Trees House Ltd* (1947) KB130
   (ඇ) *Hasley v. Baxendale* (1854) 9 Exch 341
   (ඈ) *Carlill v. Carbolic Smoke Ball Co* (1893) 1 QB 256
   (ඉ) *Jayawickrama v. Amarasuriya* (1918) 20 N.L.R at pp.203&294

(4 × 5 = ලකුණු 20)

4. i. 'යම් යම් අශක්නුතාවයන් යටතේ කටයුතු කරන පුද්ගලයින්ට පූර්ණ ගිවිසුම් ශක්‍යතාවය ලබා නොදීම මගින් නීතිය එම පුද්ගලයින් ආරක්ෂා කරයි'. සුදුසු උදාහරණ ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න.

ii. පෙරේරා රිය අනතුරකින් පියා මිය ගිය සිය මිණිපිරිය වන හේමාව හදා වඩා ගනී. ඇයගේ දහසය වන උපන් දිනය දා පෙරේරා ඇයට රුපියල් ලක්ෂ දෙකක් සහ දියමන්ති මුද්දක් තිළිණ කලේය. හේමාගේ මව වන සෞම්‍යා තිළිණය පිළිගත්තාය. හේමා එම දියමන්ති මුදුව සිය පෙම්වතා වන ලක්කිකට ත්‍යාග කලේ ඔවුන්ගේ ප්‍රේම සම්බන්ධතාවය සිහිවනු පිණිසය. තවද ඇය රුපියල් ලක්ෂ දෙක ඉහල ප්‍රමිතියෙන් යුක්ත ලැප්ටොප් යන්ත්‍රයක් මිල දී ගැනීම වෙනුවෙන් වැය කලේ එය සිය අධ්‍යාපන කටයුතු උදෙසා යොදාගැනීමේ අදහසිනි.

ඉහත ගනුදෙනුවල නෛතික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

(10×2=ලකුණු 20)

5. පහත දැක්වෙන ප්‍රකාශවල වලංගුතාවය සාකච්ඡා කරන්න.

(අ) රීතිමය වශයෙන් *Donatio inter vivos* ත්‍යාගයක් අවලංගු කල නොහැක.

(ආ) ගිවිසුම ඉටු කිරීම ගිවිසුමේ සඳහන් විධිවිධාන සමග නිශ්චිතවම අනුකූල විය යුතුය.

(10×2=ලකුණු 20)

6. '... ඇතැම් අවස්ථාවල සම්මත ආකෘති ගිවිසුම්වල නියම විසින් යම් පාර්ශවයක වගකීම මුක්ත කිරීම හෝ සීමා කිරීම සිදු කරනු ලබන්නේ යම් හෙයකින් නිදහසේ කැමැත්ත පල කිරීමට අවස්ථාව දුන්නේ නම් අනෙක් පාර්ශවය කිසිසේත් කැමති වනු ඇතැයි සිතිය නොහැකි තරමට සීමාව ඉක්මවා යන ආකාරයෙනි. මෙබඳු අවස්ථාවල ගිවිසුම්වලට ඇති කරගැනීමේ නිදහස අතුරුදහන් වේ. මන්ද ගිවිසුමට සම්බන්ධ වන පාර්ශවයන් අතර කේවල් කිරීමේ හැකියාවේ සමානකමක් මෙහි දී නොපවතින බැවිනි. මෙබඳු ගිවිසුම් යටතේ අවාසිසහගත තත්වයට පත්වන පාර්ශවයට සහන සැලසීම පිණිස පොදු නීතිය යම් යම් නීති සිද්ධාන්ත හඳුන්වා දුන්නේය'.

*ගිවිසුම් නීතිය, දෙවන කාණ්ඩය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, පිටු. 7*

ඉහත ප්‍රකාශය අගයන්න. විනිශ්චිත නඩු තීන්දුවලින් සුදුසු උදාහරණ දක්වමින් ඔබගේ ස්ථාවරය තහවුරු කරන්න.

(ලකුණු 20)

7. i. රයන්ට අයත් 'බකුසු ඇස' නම් පෞද්ගලික රහස් පරීක්ෂක ආයතනය විවිධ ඔත්තු අනාවරණය කරගැනීම සඳහා නීතිමය වාර්තා පරීක්ෂා කොට බැලීම, ඔත්තු බැලීම, නඩු සඳහා සාක්ෂි එකතු කිරීම සහ යම් යම් පුද්ගලයින්ගේ රැකියාව, ආදායම සහ වෙනත් තොරතුරු සනාථ කරදීම ආදී වූ කටයුතු සඳහා බෙහෙවින් ප්‍රසිද්ධය. රයන් 'බකුසු ඇස' වෙත සේවකයින් බඳවා ගන්නේ 'බකුසු ඇස' හි සේවය කරන කිසිවෙක්ට සේවා ගිවිසුම අවසන් වී වසර දෙකක් ගතවන තෙක් රට තුල තිබෙන අනෙක් රහස් පරීක්ෂක ආයතන වෙනුවෙන් සේවය කල නොහැකි බවට වූ වගන්තියක් ඇතුලත් ගිවිසුමක් මතය.

සැමියා හා බිරිඳ වන රාම් හා සීතා අනුපිලිවෙලින් රහස් පරීක්ෂකවරයෙක් ලෙස හා පිලිගැනීමේ නිලධාරිනියක ලෙස 'බකුසු ඇස' ආයතනයේ කටයුතු කරන අය වෙති. 'බකුසු ඇස' වෙතින් ඉවත් වීමට සිතාගෙන සිටින ඔවුන් සේවා ගිවිසුමේ තිබෙන නියමයන්ගේ වලංගුතාවය පිලිබඳ ඔබගේ අදහස විමසා සිටිති. ඔවුන්ට උපදෙස් දෙන්න.

ii. *'in pari delicto potior est conditio defendentis'* ආප්තයේ අර්ථය නඩු තීන්දු නීතිය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(10×2=ලකුණු 20)

8. ගිවිසුම් බලරහිත කල හැකි සාධක (vitiating factors) සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතරින් ඕනෑම දෙකක් (02) විස්තර කරන්න. ඔබගේ පිලිතුර නඩු තීන්දු නීතිය ආශ්‍රයෙන් පැහැදිලි කල යුතුය.

(අ) හුදු නිශ්ශබ්දතාවය අවනිදේශනයක් නොවේ.

(ආ) රෝම ලන්දේසි නීතිය ගිවිසුම් නීතිය තුල වැරදීම පිලිබඳ තුන්වන ප්‍රවර්ගයක් ද හඳුනාගනී.

(ඇ) යම් ගිවිසුම්ගත පාර්ශවයක අනුමැතිය ස්වේච්ඡා අනුමැතියක් නොවේ නම්, එය වෙනත් අයෙක්ගේ ප්‍රකාශයන් හෝ ක්‍රියාවන් මගින් බලපෑමට ලක්වූවක් වේ නම් එවැන්නක් ශූන්‍ය කල හැකි ගිවිසුමක් වීමට ඉඩ තිබේ.

(10×2=ලකුණු 20)

****හිමිකම් ඇවිරිණි****